# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2151/52 - 2019 නොවැම්බර් මස 29 වැනි සිකුරාදා - 2019.11.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2005 අංක 06 දරන පනතින් සංශෝධිත 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 2අ වගන්තිය යටතේ පනවනු ලබන නියමය**

2005 අංක 06 දරන පනතින් සංශෝධිත 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 2අ වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, මෙම නියමය මගින් ;

1. (අ) මුළු යෙදවුම් වටිනාකමින් සියයට හැටක් (60%) දේශීය සැපයුම්/මූලාශ්‍ර වලින් ප්‍රභවය වන්නේ නම්, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි වී ඇති හෝටල්, ආගන්තුක නිවාස, ආපනශාලා හෝ සමාන සේවා සපයන අනෙකුත් ඒ හා සමාන ආයතන විසින් සපයන සේවා මත ශූන්‍ය අනුප්‍රමාණයට (0%),

(ආ) මූල්‍ය සේවා සැපයීම මත සියයට පහළොවක (15%) අනුප්‍රමාණයට,

(ඇ) 2018 නොවැම්බර් මස 01 දිනැති අංක 2095/20 දරන *අති විශෙෂ ගැසට් නිවේදනයෙහි* උපලේඛනයේ I වන හා II වන තීරුවල සංයෝජිත වර්ගීකරණ සංකේත හා විස්තරයෙහි සඳහන් කරනු ලැබ ඇති භාණ්ඩ ආනයනය මත එම උපලේඛනයේ III වන තීරුවේ ඊට අනුරූපීව නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණයට, සහ

(ඈ) මෙම ඡේදයේ (අ), (ආ) සහ (ඇ) උපඡේද යටතේ දක්වා ඇති සේවා සැපයීම/භාණ්ඩ ආනයනය හැර අනෙකුත් භාණ්ඩ ආනයනය සහ/හෝ සැපයීම හෝ සේවා සැපයීම මත සියයට අට (8%) අනුප්‍රමාණයට,

එකතු කළ අගය මත බද්ද අයකළ යුතු බව ප්‍රකාශයට පත් කරමි.

2. 2005 අංක 06 දරන පනතින් සංශෝධිත 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 2අ වගන්තිය යටතේ පනවන ලද 2018 නොවැම්බර් මස 01 දිනැති අංක 2095/19, 2019 ජූනි මස 01 දිනැති අංක 2125/69 හා 2019 ඔක්තෝබර් මස 31 දිනැති අංක 2147/59 දරන *අති විශෙෂ ගැසට් පත්‍ර* මගින් ප්‍රකාශිත නියමයන් මෙයින් අවලංගු කරමි.

3. මෙම නියමය 2019 දෙසැම්බර් මස 01 වැනි දින සිට බලපැවැත්වෙන බව ප්‍රකාශයට පත් කරමි.

මහින්ද රාජපක්ෂ,
මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය.

2019ක් වූ නොවැම්බර් මස 29 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

12 - 526

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.